## මහා නගර සභාව - කඩුවෙල

## <u>සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2027 වර්ෂය</u>

2027 වර්ෂය තුළ පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා , කඩුවෙල මහා නගර සභාව සමඟ ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන පිළිගත් නිෂ්පාදකයින් හෝ ඔවුන්ගේ පිළිගත් බලයලත් නියෝජිතයින්ගේ, ව්‍යාපාරික ආයතන, රාජ්‍ය සංස්ථා, පිළිගත් සැපයුම්කරුවන්, බෙදාහරින්නන්, වෙළඳුන් වෙතින් 2026.10.15 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| **(1) සැපයුම් විෂය අංකය** | **භාණ්ඩ විස්තරය** |
|---|---|
| G1 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය පාරිභෝජන ද්‍රව්‍ය (පෑන්, පැන්සල් ඇතුළු ලිපි ද්‍රව්‍ය ආදිය.) |
| G2 | කාර්යාලීය උපකරණ දැව, වානේ සහ ප්ලාස්ටික් (මේස, පුටු, අල්මාරි ආදිය.) |
| G3 | කාර්යාලීය විදුලි උපකරණ (විදුලි පංකා,විදුලි කේතල ආදිය) |
| G4 | මෝටර් රථ අමතර කොටස් (ත්‍රීවීල්, ට්‍රැක්ටර්, JCB, ලොරි ආදිය.) |
| G5 | සියළුම වර්ගයේ වාහන සඳහා ටයර්, ටියුබ් හා ටේප් |
| G6 | පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර ආදිය. |
| G7 | විජී පහන්,බල්බ්, වයර්, ස්විච්, ප්ලග් ටොප්, හෝල්ඩර් ඇතුළු හා අළුත්වැඩියා කටයුතු සඳහා සියලු උපකරණ |
| G8 | කොසු, ඉදල්, බුරුසු, සනීපාරක්ෂක පාරිභෝජන ද්‍රව්‍ය සහ පළිබෝධ නාශක |
| G9 | වෛද්‍ය උපකරණ හා ඖෂධ වර්ග (ආයුර්වේද, පශු ඖෂධ සහ බටහිර ඖෂධ) |
| G10 | ජලභීතිකා එන්නත් සැපයීම. |
| G11 | විෂබීජ නාශක දියර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ (මුඛ වාඩම්,ග්ලවුස්,පවිත්‍ර ද්‍රව්‍ය) |
| G12 | කාර්යාල තිර රෙදි සවි කිරීම සහ කාපට් ඇතිරීම |
| G13 | නිලඇඳුම් මැසීම, අවශ්‍ය රෙදි සැපයීම හා පාවහන් සැපයීම. |
| G14 | වායු සමීකරණ යන්ත්‍ර සැපයීම |
| G15 | සාමාන්‍ය ගබඩා ද්‍රව්‍ය(යකඩ/ජී.අයි පයිප්ප/ඇණ වර්ග/තීන්ත වර්ග ආදිය) |
| G16 | ගිණි නිවීමේ උපකරණ මිලදී ගැනීම හා සේවා කටයුතු |
| G17 | ක්‍රීඩා භාණ්ඩ හා කායවර්ධන උපකරණ සැපයීම |
| G18 | ජෙනරේටර්, තණකොළ කපන යන්ත්‍ර හා වතුර මෝටර් මිලදී ගැනීම. |
| G19 | බෑග් වර්ග (Bags, Briefcase) |
| G20 | පානීය ජල බෝතල් |
| G21 | පිඟන් කෝප්ප ඇතුළු සෙරමික් නිෂ්පාදන |
| G22 | පරිගණක මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිත ද්‍රව්‍ය (ටෝනර්, තීන්ත, මාස්ටර් රෝල්, රිබන් ආදිය) |
| G23 | පරිගණක උපාංග (Virus Guard, Pen Drive, UPS) හා ජාලගත උපාංග |
| G24 | ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම (ගල්, පස්, මැටි, ගඩොල්) |
| G25 | දැව සැපයීම (ලෑලි, පරාල, රීප්ප) |
| G26 | ජල නල උපකරණ සැපයීම |
| G27 | පොලිතීන්, මුද්‍රිත පොලිතීන් උර සහ පොහොර උර (පොලිසැක් මළු) සැපයීම |
| G28 | වීදුරු හා වීදුරු භාණ්ඩ |
| G29 | හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, මායිම් ගල්, සිමෙන්ති, බොලොක් ගල්, කොන්ක්‍රීට් ආශ්‍රිත භාණ්ඩ හා කොන්ක්‍රීට් කොම්පෝස්ට් බැරල් සැපයීම. |
| G30 | කෙටි ආහාර වර්ග, බීම වර්ග, කේටරින් සේවා සහ පිසූ ආහාර වර්ග සැපයීම |
| G31 | බැටරි සැපයීම |
| G32 | ගෑස්,කර්මාන්ත ගෑස් සහ ලිහිසි තෙල් සැපයීම |
| G33 | කෝලාස් හා තාර සැපයීම |

| **(2) සැපයුම් විෂය අංකය** | **සේවා/ විස්තරය** |
|---|---|
| S1 | අභ්‍යන්තර දුරකථන පද්ධති සවි කිරීම හා නඩත්තු කිරීම |
| S2 | CCTV කැමරා පද්ධතිය නඩත්තු කිරීම සහ සේවා සිදු කිරීම |
| S3 | වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා සිදුකිරීම |
| S4 | බර වාහන යන්ත්‍රෝපකරණ කුලියට සැපයීම (JCB යන්ත්‍ර,එක්ස්කැවේට, ස්නෝකල්, බූම්ට්‍රක්, ආපදා රථ) |
| S5 | ශබ්ද විකාශන යන්ත්‍ර, විදුලි ආලෝක කටයුතු හා උත්සව භාණ්ඩ සැපයීම |
| S6 | පොත් බැඳීම සහ ඒ ආශ්‍රිත සේවා |
| S7 | සනීපාරක්ෂක සේවා සැපයීම |
| S8 | මීයන් බෝවීම වැලැක්වීම හා මී උවදුර පාලනය කිරීම ආශ්‍රිත සේවා කටයුතු |
| S9 | වාහන සේවා (සර්විස්) කිරීම |
| S10 | ආදාහනාගාර අළුත්වැඩියා කටයුතු හා සේවා කටයුතු |
| S11 | සියළුම වර්ග වල වාහන අළුත්වැඩියා කිරීම |
| S12 | සියළුම වර්ග වල වාහන කුෂන් කිරීම |
| S13 | පරිගණක යන්ත්‍ර, ස`වර් පරිගණක ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර ඇතුළු යන්ත්‍ර වර්ග, අනෙකුත් විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම සහ සේවා සිදු කිරීම |
| S14 | අනතුරුදායක ගස් හා ගස්වල අතු කැපීම, කම්බි යොදා ගස් ඇද බැඳීම |
| S15 | ගොඩනැගිලි සැලසුම් කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පීය සේවා සැපයීම |
| S16 | ව්‍යුහ ඉංජිනේරු,ප්‍රමාණ සමීක්ෂක සේවාවන් සැපයීම |
| S17 | ඉඩම් මැනීම හා මට්ටම් ගැනීම සඳහා වූ සේවාවන් සැපයීම (ලියාපදිංචි මිනින්දෝරු සේවා) |
| S18 | විශේෂ නීති උපදේශන සේවා |
| S19 | ටයර් නැවත පිරවීම |
| S20 | ටයර්, ටියුබ් නඩත්තු කටයුතු (පැච් දැමීම, කැපුනු ටයර් නැවත සැකසීම සහ ටයර් ටියුබ් ටේප් මාරුකිරීම.) |
| S21 | බරවාහන සඳහා තහඩු වැඩ සහ තීන්ත ආලේප කිරීමේ සේවාවන් (ලොරි තට්ටු, ටිපර් බක්කි ඇතුලුව ඒ හා සමාන කටයුතු) |
| S22 | සැහැල්ලු වාහන සඳහා ටින්කර් වැඩ සහ තීන්ත ආලේප කිරීමේ සේවාවන් |
| S23 | විදුලියේ ක්‍රියාකරන අත් මෙවලම්,විදුලි මෝටර්/ජල මෝටර් සහ ඒ ආශ්‍රිත වෙනත් උපකරණ අලුත්වැඩියාව සහ සේවා සිදු කිරීම. |
| S24 | ගොඩනැගිලිවල විදුලි පද්ධති සවි කිරීම හා නඩත්තු කිරීම. |
| S25 | ජල නල කාර්මික සේවා සහ නඩත්තුව |
| S26 | භූමි නිර්මාණ කටුයුතු සඳහා වූ සේවාවන් සැපයීම (මල්ගස් කප්පාදු කිරීම, වෙනත් ගස්වල අතු ඉති කපා නඩත්තු කිරීම සහ තණකොළ කපා නඩත්තු කිරීම) |
| S27 | ලිපි ශීර්ෂ පොත්, ප්‍රකාශන මුද්‍රණය කිරීම, පෝස්ටර් හා බැනර් මුද්‍රණය කිරීම, නාම පුවරු, රබර් මුද්‍රා සහ දින මුද්‍රා සකස් කිරීම |
| S28 | බෞද්ධ කොඩි,සිංහ කොඩි,පාට කොඩි (පතාක කොඩි) මුද්‍රණය කිරීම |
| S29 | භාෂා පරිවර්තන කටයුතු |
| S30 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය - මෘදුකාංග සංවර්ධනය හා පරිගණක ජාලගත කිරීම |
| S31 | කම්මල් වැඩ, පෑස්සුම් කටයුතු |
| S32 | සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන් (Cida ආයතනයේ ලියාපදිංචි වී තිබේ නම්, එම තොරතුරු ඉදිරිපත් කළ යුතු යි.) |
| S33 | කසල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියේදී ජනනය වන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය බාහිර පාර්ශවයන් වෙත විකිණීම. |
| S34 | කසල අංගනයේ සිට බිම් පිරවුම් වෙත කසල ප්‍රවාහනය කිරීම සඳහා ටිපර් ලොරි රථ දෛනික කුලී පදනම මත ලබා ගැනීම. |
| S35 | අනතුරුදායක ගස් හා ගස්වල අතු ආරාක්ෂිතව ඉවත් කර ගැනීම (පුහුණු ශ්‍රමය හා අවශ්‍ය උපකරණ සතු විය යුතු යි) |
| S36 | කාර්යය මණ්ඩලය ප්‍රවාහනය සඳහා කුලී පදනම මත වාහන ලබා ගැනීම (කාර්/ කැබ්) |

**<u>සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි</u>**

❖ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය.

1) අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය.

   a) ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත
   b) සමාගම් ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත
   c) සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය
   d) වැට් බදු සඳහා ආයතනය ලියාපදිංචි වී ඇති නම් එම සහතිකය ඇමිණිය යුතු අතර, එය 2027.01.01 දිනට වලංගුව තිබිය යුතු ය.

❖ ඉල්ලා ඇති ලිපිලේඛන අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකර තිබීම සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි නොකිරීමට හේතුවක් වනු ඇත.

2) එක් එක් විෂයන් සඳහා වෙන් වෙන් ව අයදුම්පත් ඉදිරිපත් කලයුතු අතර, සෑම අයදුම්පතක් සමඟ **<u>රු. 5,000.00+VAT 18%</u>** ගාස්තුවක් ද, **<u>S-14 විෂය අයිතමය යටතේ රු. 1,000.00+VAT 18%ක් ද</u>**, අයකරනු ලබන අතර එම මුදල **<u>නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ "සරප්" වෙත ගෙවා ලබාගත් කුවිතාන්සියක්</u>** ලබා ගැනීමෙන් හෝ **<u>"නාගරික කොමසාරිස් - කඩුවෙල මහා නගර සභාව" යන නමට චෙක්පත්</u>** මගින් ගෙවීම් සිදුකර, අදාළ චෙක්පතෙහි/ මුදල් ගෙවන ලද කුවිතාන්සියෙහි පිටපතක් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

3) **මෙම සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2027 වර්ෂයට පමණක් වලංගු වේ.** සාමාන්‍යයෙන් ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. නමුත්, වෙනත් අයගෙන් ද මිල ගණන් කැඳවීම් කර ඒ අනුව, භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීමේ හිමිකම කඩුවෙල මහා නගර සභාව සතුවේ.

4) සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් මුදල් ගෙවීමක් ලබා දෙනු නොලැබේ.

5) පිරිවිතර සහ නියමයන්ට අනුකූලව සැපයුම්/සේවාවන් සතුටුදායක අන්දමින් සැපයීමෙන් පසුව සැප යුම්කරුවන්ට ගෙවීම කරනු ලැබේ. **<u>යම් ඇණවුමක් ලබාදීමෙන් පසු දින 60ක ගෙවීම් කාලයක් ලබාදිය යුතු අතර, අදාළ ඇණවුම් සැපයීමේ දී සිදුවන ප්‍රවාහන ආදී යම් අමතර වියදමක් වේ නම් එය සැපයුම්කරු විසින් දැරිය යුතු ය.</u>**

6) සභාව විසින් තම ආයතනය තෝරාගත හොත්, අප විසින් එවනු ලබන මිල ගණන් විමසුම් සඳහා පිළිතුරු එවිය යුතු අතර, එසේ අනුයාත වාර 03 දී පිළිතුරු එවා නොතිබීම ඔබ ආයතනය ලියාපදිංචි සැපයුම්කාර ලේඛනයෙන් ඉවත් කිරීමට හේතුවක් වනු ඇත.

7) සමාන භාණ්ඩ හා සේවා සැපයීමේ හැකියාව වසර තුනක(03) පළපුරුද්දක් ඇති බවට ලිඛිත සාක්ෂි අයදුම්පතුය සමඟ අමුණා තිබිය යුතුය. සිවිල් කාර්යයන් සඳහා ලියාපදිංචි වන ICTAD/CIDA ආයතනයේ ලියාපදිංචි වූ සහතික පිටපත් ඇමිණිය යුතු අතර එය 2027.01.01 දිනට වලංගු වී තිබිය යුතුය.

මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් සිංහල බසින් සකස් කරන ලද අයදුම්පත www.kaduwela.mc.gov.lk වෙබ් අඩවියෙන් භාගත කළ හැකිය. ලබා දී ඇති ආකෘතියට අනුව අයදුම්පත් සම්පූර්ණ කළ යුතුවේ.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඊට අදාළ ලිපි ලේඛන ආදිය 2026.10.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදංචි කිරීම - 2027"** යනුවෙන් සඳහන් කර **"නාගරික කොමසාරිස් - කඩුවෙල"** යන ලිපිනයට ලියාපදිංචි තැපලෙන් යොමු කිරීම හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය .
තවද, අයදුම්පත් කැඳවන අවසන් දිනෙන් පසු කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.
වැඩිදුර තොරතුරු සඳහා කාර්යාල වේලාවන් තුළ දී පැමිණ ලබාගත හැකි අතර, දුරකථන අංක - 0112-537162 / 0112 - 539562 (ප්‍රසම්පාදන අංශය) හෝ 0112 571200 මගින් විමසා දැනගත හැකිය.

2026.09.08 වන දින
කඩුවෙල මහා නගර සභා කාර්යාලයේදීය

එස්.ඒ.නදීෂා ඩී.සපරමාදු,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.